## බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ
## නියාමන සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය.

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : බන්ධනාගාර
යොමු අංකය : D8/21/බ.පරි/II ජේලර් දිනය : 2024.09.04

1.2 අමාත්‍යාංශය : අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා
යොමු අංකය :MOJ/Prison AD/AD06/ IIජේ/II පු.නි-බ.ගැ.ප දිනය : 2024.10.09

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
යොමු අංකය : DMS/1146 VIII දිනය : 2022.10.25

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :
යොමු අංකය :EST-2/RECRU/05/4859 දිනය : 2024.07.18

1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : NSCC/03/40/94/SR දිනය : 2019.04.03

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :
යොමුඅංකය : PSC/EST/03-01-18/02/2024 දිනය : 2025.05.21

02. පත්කිරීමේ බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

03. සේවා ගණය පිළිබඳ විස්තර :

3.1 සේවා ගණය : නියාමන සේවා

3.2 ශ්‍රේණි :

- ජේලර් - II පෙළ /පුනරුත්ථාපන නිලධාරී - II පෙළ
- ජේලර් - I පෙළ /පුනරුත්ථාපන නිලධාරී - I පෙළ
- ප්‍රධාන ජේලර් / ප්‍රධාන පුනරුත්ථාපන නිලධාරී

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

බන්ධනාගාර ආයතන ප්‍රධානියාගේ කාර්යභාරය ඉටුකිරීමට සහයවීම, ආයතනයේ පරිපාලන කටයුතු මනාව පවත්වාගෙන යාම, අධීක්ෂණය කිරීමත්, ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන සියලු වගකීම් ඉටුකිරීම, තමන් වෙත පවරනු ලබන රාජකාරි හා කාර්යයන් ඉටුකිරීම.

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත යොෂ්‍යතාව හා කුසලතාව පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතු වේ.)

05. වැටුප් :

5.1 වැටුප් කේත අංකය : ජේලර් - II පෙළ / පුනරුත්ථාපන නිලධාරී - II පෙළ - RS - 03 - 2016
ජේලර් - I පෙළ / පුනරුත්ථාපන නිලධාරී - I පෙළ - RS - 04 – 2016
ප්‍රධාන ජේලර් /ප්‍රධාන පුනරුත්ථාපන නිලධාරී - RS - 05 – 2016



nd

5.2 මාසික වැටුප් පරිමාණය :

- ජේලර් - II පෙළ / පුනරුත්ථාපන නිලධාරී -II පෙළ
  රු.32,790 - 7 x 370 - 2 x 495 - 25 x 660 - 52,870
- ජේලර් -I පෙළ / පුනරුත්ථාපන නිලධාරී -I පෙළ
  රු.37,030 – 24 x 660 - 52,870
- ප්‍රධාන ජේලර් / ප්‍රධාන පුනරුත්ථාපන නිලධාරී
  රු.42,425 – 17 x 775 - 55,600

5.3 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| ජේලර් - II පෙළ / පුනරුත්ථාපන නිලධාරී - II පෙළ | පියවර 01 | රු.32,790/- |
| ජේලර් - I පෙළ / පුනරුත්ථාපන නිලධාරී - I පෙළ | පියවර 01 | රු.37,030 /- |
| ප්‍රධාන ජේලර් / ප්‍රධාන පුනරුත්ථාපන නිලධාරී | පියවර 01 | රු.42,425 /- |

**06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු**

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා තනතුරු වලට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | | කාර්යයන් |
|---|---|---|---|---|
| | | පිරිමි | කාන්තා | |
| ජේලර් | II පෙළ | 446 | 30 | බන්ධනාගාරය තුළ ආරක්ෂාව රැකවරණය, පුනරුත්ථාපනය විනය පාලනය වැනි බන්ධනාගාර පරිපාලන කටයුතු ඉටු කිරීම හා අධිකරණවලට සිර සැකකරුවන් ඉදිරිපත් කිරීම, අධීක්ෂණය, අනෙකුත් නිලධාරීන්ගේ රාජකාරි කටයුතු අධීක්ෂණය හා මෙහෙයවීම. |
| පුනරුත්ථාපන නිලධාරී | II පෙළ | 109 | 25 | බන්ධනාගාරය තුළ සියළුම පුනරුත්ථාපන කටයුතු සහ ඊට අදාළ ක්ෂේත්‍ර කටයුතු ඉටු කිරීම. |
| ජේලර් | I පෙළ | 59 | 04 | බන්ධනාගාරය තුළ ආරක්ෂාව රැකවරණය, පුනරුත්ථාපනය විනය පාලනය වැනි බන්ධනාගාර පරිපාලන කටයුතු ඉටුකිරීම හා අධිකරණ වලට සිර සැකකරුවන් ඉදිරිපත් කිරීම අධීක්ෂණය අනෙකුත් නිලධාරීන්ගේ රාජකාරි කටයුතු අධීක්ෂණය හා මෙහෙයවීම බන්ධනාගාර ආයතනයක පරිපාලනයට සහාය වීම. |
| පුනරුත්ථාපන නිලධාරී | I පෙළ | 11 | 02 | බන්ධනාගාරය තුළ සියලුම පුනරුත්ථාපන කටයුතු අධීක්ෂණය සහ ඔහුට අදාළ අනෙකුත් බන්ධනාගාරවල පුනරුත්ථාපන නිලධාරීන්ගේ කටයුතු සඳහා පුනරුත්ථාපන අංශවල කටයුතු අධීක්ෂණය කිරීම. |
| ජේලර් | ප්‍රධාන | 30 | 03 | බන්ධනාගාරය තුළ ආරක්ෂාව රැකවරණය, පුනරුත්ථාපනය විනය පාලනය, අධිකරණ කටයුතු ඇතුළු සමස්ථ බන්ධනාගාර පරිපාලන කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය. |
| පුනරුත්ථාපන නිලධාරී | ප්‍රධාන | 05 | 02 | බන්ධනාගාරය තුළ සියළුම පුනරුත්ථාපන කටයුතු අධීක්ෂණය සහ ඔහුට අදාළ අනෙකුත් බන්ධනාගාරවල පුනරුත්ථාපන නිලධාරීන්ගේ කටයුතු සහ පුනරුත්ථාපන අංශවල කටයුතු අධීක්ෂණය කිරීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

| | |
|---|---|
| II පෙළ ජේලර් | : 476 |
| II පෙළ පුනරුත්ථාපන නිලධාරි | : 134 |
| I පෙළ ජේලර් | : 63 |
| I පෙළ පුනරුත්ථාපන නිලධාරි | : 13 |
| ප්‍රධාන ජේලර් | : 33 |
| ප්‍රධාන පුනරුත්ථාපන නිලධාරි | : 07 |

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය | |
|---|---|---|
| | II පෙළ ජේලර් | II පෙළ පුනරුත්ථාපන නිලධාරි |
| විවෘත | 50% | 50% |
| සීමිත | 25% | 50% |
| කුසලතා | 25% | - |

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : II පෙළ ජේලර්/II පෙළ පුනරුත්ථාපන නිලධාරි

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළු විෂයන් හතර (04) කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයකින් (06) එකවර සමත්ව තිබීම

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයන් තුන (03) කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.2.2.3 පළපුරුද්ද : අදාළ නොවේ.

7.2.2.4 කායික සුදුසුකම් :i.පිරිමි - අවම උස අඩි 05 අඟල් 06 පපුව හුස්ම නාල්ලා අඟල් 32 ක් විය යුතුය.

ii.කාන්තා -අවම උස අඩි 05 අඟල් 04 ක් විය යුතුය.

iii.සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත්

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු අතර, එය පොලිස් නිශ්කාෂණ වාර්තා මඟින් සනාථ කර ගැනීමට කටයුතු කෙරේ.

iii. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික මානසික යෝග්‍යතාවයකින් යුක්ත අවිවාහක අයවළුන් විය යුතුය. (දික්කසාදවූවන් හා වැන්දඹුවන් අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.)

iv. සුදුසුකම් පිළිබඳ සීමාවන් : ආගමික පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකුට අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට අවසර නොමැත.

v. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.2.2 හා 7.2.3 හි දක්වා ඇති සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.



rd

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 26 ට නොවැඩි

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගයක, සහ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ ශාරීරික හා මානසික යෝග්‍යතා පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

- පළමුව ලිඛිත විභාගය පවත්වනු ලැබේ. ලිඛිත විභාගයේදී සියළුම විෂයයන් සඳහා 40% කට වඩා ලකුණු ලබා ගත යුතුය. එසේ ලකුණු ලබාගත් අයදුම්කරුවන් පවතින පුරප්පාඩු අනුව ලිඛිත විභාගයේ වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් 1:3 අනුපාතයට ශාරීරික යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

- ශාරීරික හා මානසික යෝග්‍යතාවය
  අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කිරීමට පෙර ශාරීරික හා මානසික යෝග්‍යතා පරීක්ෂණයක් පවත්වනු ලැබේ. මෙම පරීක්ෂණ මණ්ඩලය බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් පත්කරනු ලැබේ. මෙම පරීක්ෂණයේදී ඔරොත්තුදීමේ හැකියාව, දෘෂ්ඨිය, ශ්‍රවණය, හා මානසික තත්වය පරීක්ෂා කරන අතර, ස්වාභාවික හා කෘතිම (පච්ච කෙටීම වැනි) ශාරීරික වෙනස්කම් නොතිබිය යුතුය.
  ලිඛිත විභාගයෙන් හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු එකතුව අනුව වැඩිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්ගේ පොලිස් නිශ්කාෂණ වාර්තා යහපත් නම් බඳවා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| සාමාන්‍ය දැනීම | 100 | 40 |
| එකතු කිරීම ඇතුළු ගණිතය | 100 | 40 |

විෂයය නිර්දේශය ඇමුණුම 01 හි දැක්වේ.

7.2.4.1.1 විභාගය පවත්වන බලධරයා:බන්ධනාගාර කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය-අදාළ නොවේ.

7.2.4.4. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාල නොවේ |
| ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | 10 | |
| පරිගණක සාක්ෂරතාවය | 10 | |
| ක්‍රීඩා කුසලතා | 20 | |
| නායකත්වය සහ ප්‍රජා සේවා කටයුතු | 20 | |
| විශේෂ දක්ෂතා හා කුසලතා | 15 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 10 | |

ලකුණු දීමේ පටිපාටිය ඇමුණුම 02 හි දැක්වේ.

nd

සටහන -

1. ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, එක් එක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටිය අනුමත කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ. විස්තරාත්මක ලකුණු පටිපාටිය අයදුම්පත් කැඳවීමේ නිවේදනයට ඇතුළත් කර ප්‍රසිද්ධ කළ යුතු වේ.

2. ලිඛිත විභාගයේ සහ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලද ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාවට අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

7.2.4.4.1. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

7.2.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ පළකිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පලකිරීම සහ වෙබ් අඩවියේ පලකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3. සීමිත බඳවා ගැනීම :

7.3.1. බඳවා ගන්නා ශ්‍රේණිය : II පෙළ ජේලර් / II පෙළ පුනරුත්ථාපන නිලධාරී

7.3.2. සුදුසුකම් :

7.3.2.1. අධ්‍යාපන සුදුසුකම් : අදාළ නොවේ.

7.3.2.2. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.3.2.3. පළපුරුද්ද :

i. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව සුදුසුකම් පරීක්ෂා කරන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වැටුප් වර්ධක පහක් (05) උපයාගෙන තිබීම සහ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

ii. බන්ධනාගාර දෙපාර්තමේන්තුගත තනතුරක පහත සඳහන් උපලේඛනයේ පරිදි නියමිත සේවා කාලයක් සම්පූර්ණ කරන නිලධාරියකු විය යුතුය.

උපලේඛණය :

| | තනතුර | අවශ්‍ය අඛණ්ඩ ස්ථිර සේවා කාලය |
|---|---|---|
| 01 | සැරයන් | 06 |
| 02 | කර්මාන්ත පරිපාලක | 06 |
| 03 | I පෙළ වෘත්තීය උපදේශක | 06 |
| 04 | කෘෂිකර්ම උපදේශක | 06 |
| 05 | කර්මාන්ත ෆෝමන් | 06 |
| 06 | නියාමකවරු | 12 |
| 12 | සරඹ උපදේශක | 12 |
| 07 | රියදුරු | 12 |
| 08 | කෘෂිකර්ම ඕවර්සියර් | 12 |
| 09 | ඖෂධ සංයෝජක | 12 |
| 10 | II පෙළ වෘත්තීය උපදේශක | 12 |
| 11 | දැනට සේවයේ නියුතු පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ඇතිඉහත ඕනෑම තනතුරක නිලධාරියෙකු | 05 |

 nd

සටහන :
ඉහත තනතුරු දරන නිලධාරීන් සුදුසුකම් ලැබීමට අවශ්‍ය සේවා කාලය සම්පූර්ණ කර නොමැති අවස්ථාවක ඔවුන්ගේ පූර්ව තනතුරේ සේවා කාලය වර්තමාන තනතුරට එකතු කොට වසර 12 ක දෙපාර්තමේන්තුගත සේවා කාලයක් සම්පූර්ණ කරයි නම් ඔවුන් ලිඛිත පරීක්ෂණය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි.

7.3.2.4. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5. වෙනත් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

III. තනතුරට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

V. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.3.2 සිට 7.3.3 දක්වා ඇති සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3. වයස : අදාළ නොවේ.

7.3.4. බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගයේදී සියළුම විෂයයන් සමත්ව ඉහලම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව තෝරාගනු ලැබේ.

7.3.4.1. ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. බන්ධනාගාර ආඥා පනත හා දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග | 100 | 40 |
| 2. මානව හිමිකම් හා සිරකරුවන්ට අදාල ජාත්‍යන්තර නීති රීති | 100 | 40 |

විෂයය නිර්දේශය ඇමුණුම 03 හි දැක්වේ.

7.3.4.1.1. විභාගය පවත්වන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

7.3.4.2. වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වේ.

7.3.4.4. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : සියලුම බන්ධනාගාර ආයතන ප්‍රධානීන් වෙත ලිඛිතව දැන්වීම් කර නිලධාරීන් දැනුවත් කිරීම සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කිරීම මගින්

nd

7.4 කුසලතා මත බඳවා ගැනීම

7.4.1 බඳවා ගන්නා ශ්‍රේණිය : II පෙළ ජේලර් තනතුර සඳහා පමණි

7.4.2 සුදුසුකම් :

7.4.2.1 අධ්‍යාපන සුදුසුකම් : අදාළ නොවේ.
7.4.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.4.2.3 පළපුරුද්ද : බන්ධනාගාර සැරයන්වරයකු වශයෙන් වසර 06 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම හා නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම.

7.4.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.4.2.5 වෙනත් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
III. තනතුරට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.
IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
V. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.4.2 සිට 7.4.3 දක්වා ඇති සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.4.3 වයස : අදාළ නොවේ.

7.4.4 බඳවා ගැනීමේ ක්‍රමය : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ඉහලම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පවතින පුරප්පාඩු අනුව උසස් කරනු ලැබේ.

7.4.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.4.4.2. වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.4.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.4.4.4. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය:
පවතින පුරප්පාඩු සංඛ්‍යාව 1:2 අනුපාතය අනුව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨත්වය | 60 | අදාළ නොවේ. |
| අධ්‍යාපන සුදුසුකම් හා පාඨමාලා | 15 | |
| ප්‍රශංසා | 05 | |
| ක්‍රීඩා | 05 | |
| සමිති සමාගම්වල දැරූ තනතුරු | 05 | |
| දැරූ වගකීම් හා කාර්යාල සේවය | 05 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |

ලකුණු දීමේ පටිපාටිය ඇමුණුම 04 හි දැක්වේ.

7.4.4.4.1. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා :
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්



nd

7.4.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : සියලුම බන්ධනාගාර ආයතන ප්‍රධානීන් වෙත ලිඛිතව දැන්වීම කර නිලධාරීන් දැනුවත් කිරීම සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කිරීම මගින්

08. කාර්යක්ෂමතා කඩඉම් :

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | II පෙළ ජේලර්/II පෙළ පුනරුත්ථාපන නිලධාරී තනතුරට බඳවාගෙන වසර 03 ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණයක් මගින් (ඇමුණුම 05) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II පෙළ ජේලර්/II පෙළ පුනරුත්ථාපන නිලධාරී තනතුරට බඳවාගෙන වසර 05 ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණයක් මගින් (ඇමුණුම 06) |

8.2කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : අවම වශයෙන් වසරකට එක්වරක්

8.3කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද: බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

09. භාෂා ප්‍රවීණතාවය

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පත්වීම් දින සිට වසර 03 ක් ඉකුත් වීමට පෙර ලබා ගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම.

10.1 II පෙළ ජේලර්/II පෙළ පුනරුත්ථාපන නිලධාරී තනතුරේ සිට I පෙළ ජේලර්/I පෙළ පුනරුත්ථාපන නිලධාරී තනතුරට උසස් කිරීම.

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:

i. පත්වීම ස්ථිර කර තිබීම.

ii. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට 11 පෙළ ජේලර්/ 11 පෙළ පුනරුත්ථාපන නිලධාරී තනතුරේ වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම.

iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුශංගික චක්‍ර ලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

iv. I වන හා II වන කාර්යක්ෂමතා කඩඉම් විභාග නියමිත දිනට සම්පූර්ණ කර තිබීම.

v. අදාළ මට්ටමේ රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබා තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :

පත් කිරීමේ බලධාරියා විසින් ඇතිවන පුරප්පාඩු අනුව අයදුම්පත් කැඳවීමෙන් පසු .සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමෙන් අනතුරුව පවතින පුරප්පාඩු අනුව I පෙළ ජේලර් / I පෙළ පුනරුත්ථාපන නිලධාරී තනතුරට උසස් කිරීමට පත් කිරීමේ බලධාරියා විසින් කටයුතු කරනු ලැබේ.

I පෙළ ජේලර් / I පෙළ පුනරුත්ථාපන නිලධාරී තනතුරට උසස් කිරීම සඳහා පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණයන් | තෝරා ගැනීමට සලකා බලන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨතාවය සඳහා | 60 | අදාළ නොවේ. |
| අධ්‍යාපන සුදුසුකම් හා පාඨමාලා | 10 | |
| හදාරා ඇති පාඨමාලා හා පුහුණු වැඩසටහන් | 05 | |
| ප්‍රශංසා | 05 | |
| ක්‍රීඩා | 10 | |
| සමිති සමාගම්වල දැරූ තනතුරු | 05 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | 05 | |
| එකතුව | 100 | |

10.2. I පෙළ ජේලර්/I පෙළ පුනරුත්ථාපන නිලධාරී තනතුරේ සිට ප්‍රධාන ජේලර්/ප්‍රධාන පුනරුත්ථාපන නිලධාරී තනතුරට උසස් කිරීම.

10.2.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව:

10.2.1.1.සපුරාලිය යුතු සුදුසුකම්:

i. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට 1 පෙළ ජේලර්/ 1 පෙළ පුනරුත්ථාපන නිලධාරී තනතුරේ වසර පහක (05) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම.

ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුශංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

උසස් කිරීමේ ක්‍රමය :

පත් කිරීමේ බලධාරියා විසින් ඇතිවන පුරප්පාඩු අනුව අයදුම්පත් කැඳවීමෙන් පසු සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමෙන් අනතුරුව පවතින පුරප්පාඩු අනුව ප්‍රධාන ජේලර් /ප්‍රධාන පුනරුත්ථාපන නිලධාරී තනතුරට උසස් කිරීම පත් කිරීමේ බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

ප්‍රධාන ජේලර් /ප්‍රධාන පුනරුත්ථාපන නිලධාරී තනතුරට උසස් කිරීම සඳහා පවත්වන සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණයන් | තෝරා ගැනීමට සලකා බලන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨතාවය සඳහා | 60 | අදාළ නොවේ. |
| අධ්‍යාපන සුදුසුකම් හා පාඨමාලා | 15 | |
| හදාරා ඇති පාඨමාලා හා පුහුණු වැඩසටහන් | 05 | |
| ප්‍රශංසා | 05 | |
| ක්‍රීඩා | 05 | |
| සමිති සමාගම්වල දැරූ තනතුරු | 05 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

11. තනතුරුවලට පත් කිරීම : අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :අදාළ නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ : අදාළ නොවේ.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :
මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාල වේ.

නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මඟින් ලබා දී ඇති RS 03 – 2016 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරින් සියළුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට හෝ ශ්‍රේණියට පත්කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාල තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවැති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාල තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපි වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

II පෙළ ජේලර් තනතුරේ සේවයේ නියුතු සියලූ නිලධාරින් මෙම බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් II පෙළ ජේලර් තනතුරට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

II පෙළ පුනරුත්ථාපන නිලධාරි තනතුරේ සේවයේ නියුතු සියලූ නිලධාරින් මෙම බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් II පෙළ පුනරුත්ථාපන නිලධාරි තනතුරට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

I පෙළ ජේලර් තනතුරේ සේවයේ නියුතු සියලූ නිලධාරින් මෙම බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් I පෙළ ජේලර් තනතුරට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

I පෙළ පුනරුත්ථාපන නිලධාරි සේවයේ නියුතු සියලූ නිලධාරින් මෙම බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් I පෙළ පුනරුත්ථාපන නිලධාරි තනතුරට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

ප්‍රධාන ජේලර් තනතුරේ සේවයේ නියුතු සියලූ නිලධාරින් මෙම බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් ප්‍රධාන ජේලර් තනතුරට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

ප්‍රධාන පුනරුත්ථාපන නිලධාරි තනතුරේ සේවයේ නියුතු සියලූ නිලධාරින් මෙම බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් ප්‍රධාන පුනරුත්ථාපන නිලධාරි තනතුරට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17.අන්තර්කාලීන විධිවිධාන : අදාළ වේ.

සකස් කළේ : අත්සන : ..........................................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : ඩබ්ලිව්.ටී.එන්. වසන්ත කුමාර
පරිපාලන නිලධාරි - I
තනතුර : බන්ධනාගාර මූලස්ථානය
දිනය : 2025/07/21 කොළඹ - 09.

පරීක්ෂා කළේ : අත්සන : ..........................................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : ඩොනල්ඩ් මුරගේ
බන්ධනාගාර කොමසාරිස් (මානව සම්පත්)
තනතුර : බන්ධනාගාර මූලස්ථානය
දිනය : 2025/07/22 කොළඹ 09.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ..........................................

තනතුර : එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

නිල මුද්‍රාව

දිනය : 2025/07/22

18. අමාත්‍යාංශ නිර්දේශය

යොමු අංකය : MOJ/Prison AD/AD06/බ.ජේ/ බ.පු.නි - බ.නෑ.ප

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2025.05.21 දින අනුමත කරන ලද බන්ධනාගාර අමාත්‍යාංශයෙහි/දෙපාර්තමේන්තුවෙහි නියාමන සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................................

නම : ආයේෂා ජිනසේන

ලේකම්
Ayesha Jinasena, P.C.
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
Ministry of Justice and National Integration
නිල මුද්‍රාව : Sri Sangaraja Mawatha,
Colombo 10.

දිනය : 2025/08/12

19. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය

යොමු අංකය : PSC/EST/03-01-18/02/2024

බන්ධනාගාර අමාත්‍යාංශයෙහි/දෙපාර්තමේන්තුවෙහි නියාමන සේවා ගණය සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2025.05.21 දින අනුමත කරන ලදී.

අත්සන : ..........................................

නම : ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න

ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2025/09/18

නිල මුද්‍රාව : ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
... ලේකම්වත්ත පාර

ඇමුණුම 01

විභාග පිළිබඳ විස්තර

01. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නියාමන සේවා ගණයට අයත් II පෙළ ජේලර්/II පෙළ පුනරුත්ථාපන නිලධාරී තනතුරු සඳහා විවෘත බඳවා ගැනීමේ තරඟ විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40 |
| එකතු කිරීම ඇතුළු ගණිතය | පැය 01 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය මත

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | සිතීමේ තර්කානුකූලතාවයත්, සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා බහුවරණ ප්‍රශ්ණ පත්‍රයකි. |
| සාමාන්‍ය දැනීම | තොරතුරු තාක්ෂණය,අපේක්ෂකයා වාසය කරන පරිසරය ඇතුළුව ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සමාජමය, සංස්කෘතික හා ආර්ථික පරිසරයද, ජාතිකව හා අන්තර්ජාතිකව වැදගත් වන නූතන කරුණු මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය ද සම්බන්ධයෙන් ඇති දැනුම පරීක්ෂා කිරීම සඳහා බහුවරණ ක්‍රමයට සකස් වූ ප්‍රශ්න පත්‍රයකි. |
| එකතු කිරීම ඇතුළු ගණිතය | ප්‍රශ්න පත්‍රය I හා II යනුවෙන් කොටස් 02 කින් යුක්තය.<br>I කොටස - එකතු කිරීමේ හැකියාව මැන බැලීම සඳහා ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය හැකි ආකාරයට ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ.<br>II පත්‍රය - ගණනය කිරීමේ හැකියාව මැන බැලීම සඳහා අනිවාර්යයෙන්ම පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න 06 කින් යුතු ප්‍රශ්න පත්‍රයක් සකස් කෙරේ. |

පවතින පුරප්පාඩු ප්‍රමාණය මෙන් 1:3 අනුපාතයට ඉහලම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

සකස් කළේ :
අත්සන :
නම : ඩබ්ලිව්.ටී.එන්. වසන්ත කුමාර
තනතුර : පරිපාලන නිලධාරී - I
දිනය : 2025/07/21
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

පරීක්ෂා කළේ :
අත්සන :
නම : ඩොනල්ඩ් මුරගේ
තනතුර : බන්ධනාගාර කොමසාරිස් (පාලන සම්පත්)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
දිනය : 2025/07/22

අත්සන :
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම :
තනතුර :
දිනය : 2025/07/22
නිල මුද්‍රාව : එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

ඇමුණුම 02

යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පිළිබඳ ආකෘතිය

01. පරීක්ෂණයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නියාමන සේවා ගණයට අයත් තනතුරු වන II පෙළ ජේලර්/II පෙළ පුනරුත්ථාපන නිලධාරී තනතුරට විවෘත බඳවා ගැනීම යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය.

02. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :

| ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍රය | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ |
| I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමන උපාධියක් හෝ ඉහළ සුදුසුකමක් සඳහා | 10 | |
| II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්, කාර්මික විද්‍යාලයකින් හෝ වෙනත් රජයේ පිළිගත් ආයතනයකින් පිරිනමන උසස් ඩිප්ලෝමාවක් සඳහා (වසර 02 ක) | 08 | |
| III. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්, කාර්මික විද්‍යාලයකින් හෝ වෙනත් රජයේ පිළිගත් ආයතනයකින් පිරිනමන අවුරුද්දක් හෝ ඊට වැඩි ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 06 | |
| 02. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | 10 | අදාළ නොවේ |
| I. උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසරකට නොඅඩු) | 10 | |
| II. ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (මාස 06 කට නොඅඩු/පැය 720 කට නොඅඩු) | 06 | |
| III. සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (වසරකට නොවැඩි හා මාස 03 කට නොඅඩු/පැය 360 කට නොඅඩු)<br>*ඉහත සුදුසුකම් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්, කාර්මික විද්‍යාලයකින් හෝ වෙනත් රජයේ පිළිගත් ආයතනයකින් පිරිනමා ඇති සහතික පත්‍ර විය යුතුය. | 04 | |
| 03. පරිගණක සාක්ෂරතාවය | 10 | අදාළ නොවේ |
| I. ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසරකට නොඅඩු) | 10 | |
| II. ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (මාස 06 කට නොඅඩු/පැය 720 කට නොඅඩු) | 06 | |
| III. සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (වසරකට නොවැඩි හා මාස 03 කට නොඅඩු/පැය 360 කට නොඅඩු)<br>• ඉහත සුදුසුකම් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්, කාර්මික විද්‍යාලයකින් හෝ වෙනත් රජයේ පිළිගත් ආයතනයකින් පිරිනමා ඇති සහතික පත්‍ර විය යුතුය. | 04 | |
| 04. ක්‍රීඩා කුසලතා | 20 | අදාළ නොවේ |
| I. ජාත්‍යන්තර ක්‍රීඩා තරගාවලිවලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම | 10 | |
| II. සමස්ත ලංකා මට්ටමේ ජයග්‍රහණ | 08 | |
| III. පළාත් මට්ටමේ ජයග්‍රහණ | 05 | |
| IV. දිස්ත්‍රික් මට්ටමේ ජයග්‍රහණ | 03 | |
| V. කොට්ඨාශ මට්ටමේ ජයග්‍රහණ | 02 | |
| VI. අන්තර් විශ්ව විද්‍යාල ජයග්‍රහණ | 02 | |
| VII. පාසල් මට්ටමේ ජයග්‍රහණ | 02 | |
| (එක් ක්‍රීඩාවක උපරිමය සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | | |

| | | |
|---|---|---|
| 05. නායකත්වය හා ප්‍රජා සේවා කටයුතු | 20 | අදාළ නොවේ |
| ශිෂ්‍යභට කණ්ඩායමේ සැරයන් හෝ ඊට ඉහළ තනතුරක් දැරීම | 06 | |
| ජනාධිපති බාලදක්ෂයකු වීම | 06 | |
| පාසැල් ප්‍රධාන ශිෂ්‍ය නායක | 06 | |
| තූර්ය වාදක කණ්ඩායමේ නායක | 06 | |
| | | |
| ශිෂ්‍යභට කණ්ඩායමේ සාමාජිකයකු වීම | 03 | |
| බාලදක්ෂ කණ්ඩායමේ සාමාජිකයකු වීම | 03 | |
| ශිෂ්‍ය නායකයකු වීම | 03 | |
| තූර්ය වාදක කණ්ඩායමේ සාමාජිකයකු වීම | 03 | |
| ප්‍රධාන ක්‍රීඩා නායක | 03 | |
| දහම් පාසල් ශිෂ්‍ය නායක | 03 | |
| සෞඛ්‍යදාන/ශාන්ත ජෝන් ගිලන් රථ සේවා/රතු කුරුස ප්‍රථමාධාර සාමාජිකයකු වීම | 03 | |
| යොවුන් සේනාංක සාමාජිකයකු වීම | | |
| දහම් පාසල් අවසාන විභාගය සමත් වීම | 03 | |
| | 03 | |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සලකා බලන වෙනත් විශේෂ සුදුසුකම් (සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් මේ සම්බන්ධයෙන් සටහන් තැබිය යුතුය.) | 03 | |
| 06. විශේෂ දක්ෂතා හා කුසලතා | 15 | අදාළ නොවේ |
| සමස්ත ලංකා ජයග්‍රහණ | 06 | |
| පළාත් මට්ටමේ ජයග්‍රහණ | 05 | |
| දිස්ත්‍රික් මට්ටමේ ජයග්‍රහණ | 04 | |
| වෙනත් ජයග්‍රහණ | 03 | |
| (එක් ඉසව්වක උපරිමය සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | | |
| 07. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 10 | අදාළ නොවේ |
| I. නායකත්වය | 04 | |
| II. පෞරුෂත්වය | 04 | |
| III. සන්නිවේදනය | 02 | |

03. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

සකස් කළේ :
අත්සන :
නම : ඩබ්ලිව්.ටී.එස්. වසන්ත කුමාර
තනතුර : පරිපාලන නිලධාරී - I
දිනය : 2025/07/21
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

පරීක්ෂා කළේ :
අත්සන :
නම : ඩොනල්ඩ් මුරගේ
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ([illegible])
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
දිනය : 2025/07/22

අත්සන :
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම :
තනතුර :
දිනය : 2025/07/22
නිලමුද්‍රාව : එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

nd

ඇමුණුම 03

විභාග පිළිබඳ විස්තර

01. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නියාමන සේවා ගණයට අයත් II පෙළ ජේලර්/II පෙළ පුනරුත්ථාපන නිලධාරී තනතුරු සඳහා සීමිත බඳවා ගැනීමේ තරඟ විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| I.බන්ධනාගාර ආඥා පනත හා දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග | පැය 03 | 100 | 40 |
| II.මානව හිමිකම් හා සිරකරුවන්ට අදාළ ජාත්‍යන්තර නීති රීති | පැය 01 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් බලය පවරන ලද ආයතනයක් විසින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය මත

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| I.බන්ධනාගාර ආඥා පනත හා දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග | අදාළ ග්‍රන්ථ 02 හි සියළුම වගන්ති |
| II.මානව හිමිකම් හා සිරකරුවන්ට අදාළ ජාත්‍යන්තර නීති රීති | ශ්‍රී ලංකා මානව හිමිකම් කවුන්සිලයේ නීති රීති හා එක්සත් ජාතීන්ගේ සිරකරුවන්ට අදාළ නීති රීති ඇතුලත්ය. |

පවතින පුරප්පාඩු ප්‍රමාණය මෙන් 1:3 අනුපාතයට ඉහලම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

සකස් කළේ :
අත්සන :
නම : ඩබ්ලිව්.ටී.එස්. වසන්ත කුමාර
තනතුර : පරිපාලන නිලධාරි - I
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.
දිනය : 2025/07/21

පරීක්ෂා කළේ :
අත්සන :
නම : ඩොනල්ඩ් මුරගේ
තනතුර : බන්ධනාගාර කොමසාරිස් (මානව සම්පත්)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
දිනය : 2025/07/22

අත්සන :
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම :
තනතුර :
දිනය : 2025/07/22
නිල මුද්‍රාව : එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

nd

ඇමුණුම 04

<u>යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ පිළිබඳ ආකෘතිය</u>

01. පරීක්ෂණයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නියාමන සේවා ගණයට අයත් තනතුරු වන II පෙළ ජේලර්/II පෙළ පුනරුත්ථාපන නිලධාරී තනතුරට ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතා මත උසස් කිරීමේ සම්මුඛ පරීක්ෂණය.

02. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. ජ්‍යෙෂ්ඨතාවය සඳහා<br>රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 හි සඳහන් විධි විධාන පරිදි සම්මුඛ පරීක්ෂණයේදී ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. | 60 | අදාළ නොවේ |
| කුසලතාවයට | 40 | අදාළ නොවේ |
| 02. අධ්‍යාපන සුදුසුකම් හා පාඨමාලා | | |
| I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමන උපාධියක් හෝ ඉහළ සුදුසුකමක් සඳහා | 08 | |
| II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්, කාර්මික විද්‍යාලයකින් හෝ වෙනත් රජයේ පිළිගත් ආයතනයකින් පිරිනමන අවුරුද්දක් හෝ ඊට වැඩි ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 06 | |
| III. ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (මාස 06 කට නොඅඩු/පැය 720 කට නොඅඩු) | 04 | |
| IV. ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (මාස 03 කට නොඅඩු/පැය 360 කට නොඅඩු) | 02 | |
| V. පරිගණක ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (මාස 06 කට නොඅඩු/පැය 720 කට නොඅඩු) | 04 | |
| VI. පරිගණක සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (මාස 03 කට නොඅඩු/පැය 360 කට නොඅඩු) | 02 | |
| VII. දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කළ දින 2 හෝ ඊට වැඩි පුහුණු වැඩසටහනක් සඳහා (උපරිම ලකුණු 05 ) | 01 | |
| (එක් විෂය ක්ෂේත්‍රයක් සඳහා ලකුණු ලබා දෙනුයේ උපරිම සුදුසුකමට පමණි.) | | |
| 03. ප්‍රශංසා සඳහා<br>පොදු 230 බී ආකෘති පත්‍රය මගින් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් ලබා දී ඇති ප්‍රශංසාවකට ලකුණු 02 ක් සහ බන්ධනාගාර අධිකාරී ප්‍රශංසාවකට ලකුණු 01 බැගින් (බන්ධනාගාර අධිකාරී ප්‍රශංසාවකට උපරිමය ලකුණු 03) ලබාදෙනු ලබන අතර, බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ දෝෂ දර්ශනයක් සඳහා ලකුණු 02 ක් ප්‍රශංසා සඳහා ලබාදෙනු ලබන උපරිම ලකුණු සීමාවට යටත්ව අඩු කරනු ලැබේ. | 05<br>05 | අදාළ නොවේ |
| 04. ක්‍රීඩා සඳහා | 05 | අදාළ නොවේ |
| I. ජාතික මට්ටමේ ක්‍රීඩා ජයග්‍රහණ සඳහා | 05 | |
| II. රාජ්‍ය සේවා තරඟ ජයග්‍රහණ සඳහා | 04 | |
| III. අන්තර් බන්ධනාගාර තරඟ ජය ගැනීම | 02 | |
| IV. බන්ධනාගාරය නියෝජනය කරමින් පලාත්/ දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩා ජයග්‍රහණ සඳහා (උපරිම ලකුණු 02) | 01 | |
| V. අන්තර් බන්ධනාගාර තරඟ සහභාගිත්වය සඳහා (උපරිම ලකුණු 01) | 1/2 | |
| (එක් ක්‍රීඩාවක් වෙනුවෙන් උපරිම මට්ටම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | | |
| 05. සමිති සමාගම්වල දැරූ තනතුරු | 05 | අදාළ නොවේ |
| I. දෙපාර්තමේන්තු මට්ටමේ සමිති සමාගම්වල ප්‍රධාන තනතුරක් සඳහා එක් වසරකට | 02 | |
| II. දෙපාර්තමේන්තු මට්ටමේ සමිති සමාගම්වල වෙනත් තනතුරක් සඳහා එක් වසරකට | 01 | |
| III. ආයතන මට්ටමේ සමිති සමාගම්වල ප්‍රධාන තනතුරක් සඳහා එක් වසරකට | 01 | |
| IV. ආයතන මට්ටමේ සමිති සමාගම්වල වෙනත් තනතුරක් සඳහා එක් වසරකට (උපරිම ලකුණු 02) | 1/2 | |
| (සටහන : ඉහත අංක 05 යටතේ ප්‍රධාන තනතුරු - සභාපති/ලේකම්/භාණ්ඩාගාරික) | | |

| | | |
|---|---|---|
| 06. දැරූ වගකීම් හා කාර්යාල සේවය<br>I. සිර මැදිරියක කාර්යභාර නිලධාරියෙකු වශයෙන් කටයුතු කිරීම එක් වසරකට<br>II. කාර්යාලයක කාර්යභාර නිලධාරි ලෙස කටයුතු කිරීම එක් වසරකට<br>III. බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායේ අවම වසර 5ක් සේවය කිරීම | 05<br>02<br>01<br>02 | අදාළ නොවේ. |
| 07. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය<br>I. නායකත්වය<br>II. සන්නිවේදන හැකියාව<br>III. පෞරුෂත්වය | 05<br>02<br>02<br>01 | අදාළ නොවේ |
| සටහන - 2.1 සඳහා ලකුණු ලබා දීමේදී අයදුම් කිරීමේදී සලකා බැලූ මූලික සුදුසුකම් හැර අනෙකුත් සුදුසුකම් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. | | |

03. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

සකස් කළේ :
අත්සන :
නම : ඩබ්ලිව්.ටී.එන්. වසන්ත කුමාර
තනතුර : පරිපාලන නිලධාරී
බන්ධනාගාර මූලස්ථානය
දිනය : 2025/07/21
කොළඹ - 09.

පරීක්ෂා කළේ :
අත්සන : ..................
නම : ඩොනල්ඩ් මුරශේ
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ([illegible])
දිනය : 2025/07/22
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

අත්සන : ..................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : ..................
තනතුර : ..................
දිනය : 2025/07/22
නිල මුද්‍රාව : ........එච්.එම්.එන්.සී. ධනසිංහ..
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

ඇමුණුම 05

විභාග පිළිබඳ විස්තර

01. විභාගයේ නම :බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නියාමන සේවා ගණයට අයත් තනතුරු වන II පෙළ ජේලර්/II පෙළ පුනරුත්ථාපන නිලධාරී තනතුර සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| I. | බන්ධනාගාර ආඥා පනත දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග හා තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාල විශෝධන විද්‍යාල ආඥා පනත | පැය 03 | 100 | 40 |
| II. | ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති | පැය 02 | 100 | 40 |
| III. | මුදල් රෙගුලාසි හා මූල්‍ය ක්‍රම | පැය 02 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා :බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : අවම වශයෙන් වසරකට එක් වරක්

05.විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | | විෂය නිර්දේශය | |
|---|---|---|---|
| I. | බන්ධනාගාර ආඥාපනත දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග හා තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාල විශෝධන විද්‍යාල ආඥා පනත | I. | බන්ධනාගාර ආඥාපනත දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග හා තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාල විශෝධන විද්‍යාල ආඥා පනත යන පනත් තුනෙහි සියළුම පරිච්ඡේද |
| II. | ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති | II. | ආයතන සංග්‍රහයේ හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ සියළුම පරිච්ඡේද |
| III. | මුදල් රෙගුලාසි හා මූල්‍ය ක්‍රම | III. | මුදල් රෙගුලාසි සංග්‍රහයේ සියළුම පරිච්ඡේද හා මූල්‍ය ක්‍රම |

සකස් කළේ :
අත්සන :............................................
නම :ඩබ්ලිව්.ටී.එස්. වසන්ත කුමාර (stamp)
තනතුර : පරිපාලන නිලධාරි - I (stamp)
දිනය : 2025/07/[illegible]
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

පරීක්ෂා කළේ :
අත්සන :............................................
නම : ඩොනල්ඩ් මුරගේ (stamp)
තනතුර බන්ධනාගාර කොමසාරිස් (මානව සම්පත්) (stamp)
දිනය : 2025/07/22 (handwritten day)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

අත්සන :............................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම :............................................
තනතුර :............................................
දිනය : 2025/07/22 (handwritten day)
නිලමුද්‍රාව :............................................
එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

ඇමුණුම 06

<u>විභාග පිළිබඳ විස්තර</u>

01. විභාගයේ නම :බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නියාමන සේවා ගණයට අයත් තනතුරු වන II පෙළ ජේලර්/ II පෙළ පුනරුත්ථාපන නිලධාරී තනතුර සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| I. මානව හිමිකම් හා සිරකරුවන්ට අදාළ ජාත්‍යන්තර නීතිරීති | පැය 02 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : අවම වශයෙන් වසරකට එක් වරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| I.මානව හිමිකම් හා සිරකරුවන්ට අදාළ ජාත්‍යන්තර නීති රීති | ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන, ශ්‍රී ලංකා මානව හිමිකම් පනත සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් නිකුත් කර ඇති සිරකරුවන්ට අදාළ නීති රීති (නෙල්සන් මැන්ඩෙලා රීති) |

සකස් කළේ :
අත්සන : ඩබ්ලිව්.පී.එන්. වසන්ත කුමාර
නම : පරිපාලන නිලධාරි - I
තනතුර : බන්ධනාගාර මූලස්ථානය
දිනය : 2025/07/21 කොළඹ - 09.

පරීක්ෂා කළේ :
අත්සන : ඩොනල්ඩ් මුරගේ
නම : බන්ධනාගාර කොමසාරිස් (මානව හිමිකම්)
තනතුර: බන්ධනාගාර මූලස්ථානය
දිනය : 2025/07/22 කොළඹ 09.

අත්සන : ........................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : ........................
තනතුර : ........................
දිනය : 2025/07/22
නිලමුද්‍රාව : එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

nd